# සා. පෙළ. සිංහල

# තල මල පිපිලා

# ඒකකය ~ 26 වැඩපොත

- 10 ශ්‍රේණිය 14 ඒකකය – නාට්‍ය පිටපත් රචනය
- 11 ශ්‍රේණිය 26 ඒකකය – තල මල පිපිලා

**(පසුගිය විභාග ප්‍රශ්නද ඇතුළත් කර ඇත.)**

( පිළිතුරු සහිතයි )



**සැකසුම – හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

{ පෙළ පොත අභ්‍යාස සමඟ G10 – 14 / G11 - 26 ඒකක ආවරණය වන පරිදි සකස් කර ඇත.}

## ➢ නාට්‍ය පිටපත් රචනය 10 ශ්‍රේණිය සිංහල (14 ඒකකය)

**01 නාට්‍ය කලාව සජීව කලාවකි.** - වේදිකා නාට්‍ය කලාව සජීව කලාවක් වීමට හේතු වන කරුණු කිහිපයකි.

- රංගගත කරන මොහොතේ ම නැරඹිය හැකි වීම
- ප්‍රේක්ෂක ප්‍රතිචාර ඒ මොහොතේ ම ලද හැකි වීම
- රංගගත කරන මොහොතේ යම් වරදක් සිදු වුව හොත් සංස්කරණය කළ නොහැකි වීම

**02 නාට්‍ය කලාව කලා මාධ්‍යයන් කිහිපයක එකතුවකි.** - කාව්‍යය, ගීතය, චිත්‍රය, සංගීතය, නර්තනය ආදි සියල්ල එක්තැන් වන කලා මාධ්‍යයකි.

**03 නාට්‍ය කලාව සාමූහික කලා මාධ්‍යයකි.** - නාට්‍යයක් බිහි කිරීම තනි පුද්ගලයකුගේ පරිශ්‍රමයක ප්‍රතිඵලයක් නොවේ. කිහිප දෙනකුගේ සහාය ඒ සඳහා අවශ්‍ය වේ. නාට්‍ය රචකයා, නාට්‍ය අධ්‍යක්ෂවරයා, නළු නිළියන්, පසුතල නිර්මාණ ශිල්පීන්, අංග රචනා ශිල්පීන්, රංගාලෝක නිර්මාණ ශිල්පීන්, රංග වස්ත්‍රාභරණ නිර්මාණය කරන්නන්, සංගීත නිර්මාණ ශිල්පීන්, ප්‍රේක්ෂකයන් හා විචාරකයන් ආදිය ඒ සඳහා නිදර්ශන සේ දැක්විය හැකි ය.

**04 'නාට්‍යය යනු කුමක් ද?** - භරතමුනි පඬිවරයා මෙසේ පවසයි: 'මිනිස් ජීවිතයේ දී මුහුණ පාන්නට සිදු වන යම් සැප හෝ දුක් සහිත අවස්ථාවක් වේ ද එය ආංගික ආදි අභිනය සතරින් දැක්වූ විට නාට්‍යය යි. - (නාට්‍ය ශාස්ත්‍රය). අභින සතර හෙවත් චතුර්විධ අභිනය යනු කුමක් ද යන්න පිළිබඳවත් නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ සඳහන් වෙයි.

1. ............................................- අංග චලන මාර්ගයෙන් අදහස් ප්‍රකාශ කිරීම.
2. ............................................- වචන මාර්ගයෙන් අදහස් ප්‍රකාශ කිරීම. මෙහි දී ගීත, කවි, ගද්‍යමය සංවාද ආදි කුමන හෝ මාර්ගයක් තෝරා ගත හැකි ය.
3. ............................................- මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශනය. කෝපය, ශෝකය, විස්මය, බිය, ආදරය, ක්‍රෑරත්වය ආදි ඕනෑ ම භාවයක් මුහුණේ ඉරියව්වලින් ප්‍රකාශයට පත් කළ හැකි ය.
4. ....................................................- ඇඳුම් පැළඳුම්, සංගීතය, වේදිකා පසුතල නිර්මාණය, රංගාලෝකනය, වේශ නිරූපණය ආදි සියලු දෑ මගින් අදහස් ප්‍රකාශනය.

**05 නාට්‍ය පිටපතක අන්තර්ගත විය යුතු ලක්ෂණ**

1. ....................................................................................................................
2. ....................................................................................................................
3. ....................................................................................................................
4. ....................................................................................................................
5. ....................................................................................................................
6. ....................................................................................................................
7. ....................................................................................................................
8. ....................................................................................................................

**06 නාට්‍යයක ශෛලි** - ප්‍රකාශන විලාසය හෙවත් නාට්‍යය ඉදිරිපත් කරන ආකාරය ශෛලිය නම් වෙයි. නාට්‍ය ශෛලි ප්‍රධාන වශයෙන් ප්‍රවර්ග දෙකකි.

01. ....................................................................................................................

නිදර්ශන ..........................................................................................................

02. ....................................................................................................................

නිදර්ශන ..........................................................................................................

| | ස්වාභාවික නාට්‍ය | ශෛලිගත නාට්‍ය |
|---|---|---|
| ශෛලිය | සාමාන්‍ය ජීවිතයට සමීප ශෛලියකින් ඉදිරිපත් කෙරෙයි. | සාමාන්‍ය ජීවිතයෙන් දුරස්ථ ශෛලියකින් ඉදිරිපත් කෙරෙයි. |
| දෙබස් | කතාබහ කරන ආකාරය සාමාන්‍ය ජීවිතයේ කතාබහ කරන ආකාරයට සමාන ය. | සම්පූර්ණයෙන් ම ගායනයෙන් හෝ කාව්‍යමය ශෛලියකින් දෙබස් ඉදිරිපත් වෙයි. |
| වේදිකාව මත හැසිරීම | ගමන බිමන, වේදිකාව මත හැසිරීම සාමාන්‍ය ආකාරයට සිදු වෙයි. | නර්තනය හෝ මුද්‍රා සහිත රිද්මානුකූල ගමන් තාල භාවිත කෙරෙයි. |
| ඇඳුම් පැලඳුම් හා වේශ නිරූපණය | ඇඳුම් පැලඳුම්, වේශ නිරූපණය ආදිය සාමාන්‍ය ජීවිතයේ දී භාවිත කෙරෙන ආකාරයට සකස් කර ගැනෙයි. | චරිත සඳහා විශේෂයෙන් නිර්මාණය කළ ඇඳුම් පැලඳුම් භාවිත වන අතර සැබෑ ජීවිතයේ සිදු කෙරෙන ආකාරයට වඩා කැපී පෙනෙන ලෙස වේශ නිරූපණය සිදු කෙරෙයි. |
| සංගීතය<br>පසුතල නිර්මාණ<br>වස්තු විෂය/ තේමාව | සංගීතය අනිවාර්ය නො වේ.<br>පසුතල නිර්මාණ භාවිත කෙරෙයි.<br>සමකාලීන සමාජ ප්‍රශ්න විෂය කර ගැනේ. | සංගීතය අනිවාර්ය වෙයි.<br>පසුතල නිර්මාණ යොදා නො ගැනෙයි.<br>බොහෝ විට ජාතක කතා, ජන කතා, සුරංගනා කතා ආදිය විෂය කර ගැනේ. (එහෙත් සමකාලීන සමාජ ප්‍රශ්න ද තේමා විය හැකි ය.) |
| නිදර්ශන | කැලණි පාලම - ආර් ආර්. සමරකෝන්<br>බෝඩිංකාරයෝ, තට්ටු ගෙවල් - සුගතපාල ද සිල්වා | මනමේ, සිංහබාහු, - එදිරිවීර සරච්චන්ද්‍ර<br>කුවේණි - හෙන්රි ජයසේන |

පාඩමේ දැක්වෙන්නේ 20 වන සියවසේ ජර්මනියේ විසූ සුප්‍රසිද්ධ නාට්‍යකරුවකු වන **බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්** විසින් රචිත **ද කොකේසියන් චෝක් සර්කල්** නම් නාට්‍යයේ පරිවර්තනයක් ලෙස **හෙන්රි ජයසේන** මහතා විසින් නිෂ්පාදනය කරන ලද **හුණුවටයේ කතාව** නම් නාට්‍යයේ අවසාන අංකයයි. (**කුවේණි** මෙතුමාගේ වෙනත් නාට්‍යකි.) හුණුවටයේ කතාව නාට්‍යයට පාදක වී ඇත්තේ අවුරුදු හයසියයකටත් වඩා පැරණි චීන ජන කතාවක් බව කියනු ලැබේ. විසි වන සියවසේ ලෝක නාට්‍ය ක්ෂේත්‍රයේ ශ්‍රේෂ්ඨතමයා බ්‍රෙෂ්ට් බව බොහෝ විචාරකයන්ගේ පිළිගැනීම යි. වෙනත් නාට්‍ය කිහිපයක් පහත දැක්වේ.

1. සුගතපාල ද සිල්වා - ..........................................................................................
2. ජයලත් මනෝරත්න- ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................
3. එදිරිවීර සරච්චන්ද්‍ර- ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................
4. දයානන්ද ගුණවර්ධන - ..........................,,...................................................
5. සෝමලතා සුබසිංහ - ..........................................................................................
6. සයිමන් නවගත්තේගම - ..........................................................................................
7. කේ. බී. හේරත් - ..........................................................................................
8. ආර්. ආර්. සමරකෝන්- ..........................................................................................

## ➢ තල මල පිපිලා 11 ශ්‍රේණිය සිංහල (26 ඒකකය)

- නාට්‍යය යනු **ශ්‍රව්‍ය දෘශ්‍ය** කලා මාධ්‍යයකි. එනම් බැලීමෙන් හා ඇසීමෙන් රස විඳින මාධ්‍යයකි. නාට්‍යය වූ කලි බැලීමෙන් රස විඳීමට ඇති කාව්‍ය විශේෂයකි. ඊට **දෘශ්‍යය** යි කියන්නේ එබැවිනි. නාට්‍යයට **රූප** හෙවත් **රූපක** යයි ද කියනු ලැබේ. එය ද එම අර්ථයෙනි.

- සැබෑ ජීවිත පුවතක් හෝ ගොතන ලද කතාවක් ප්‍රේක්ෂක සමූහයක් ඉදිරියේ චතුර් අභිනය ........................................................................................................ යොදා ගනිමින් නිරූපණය කිරීම නාට්‍යයක් ලෙස සරලව අර්ථ දැක්විය හැකි ය.

- එහි මූලික ම කර්තව්‍යය වන්නේ නාට්‍ය පිටපත හෙවත් .................................... යි. රචකයා විසින් තමා ලද අත්දැකීමක්, කතා පුවතක් හෝ වෙනත් වස්තු බීජයක් ඇසුරු කරගෙන තම පරිකල්පනය ද ඇසුරින් නාට්‍ය පිටපත රචනා කරයි.

- "නළුවෝ ද නිළියෝ ද වෙස් වළා ගෙන අවුත් ප්‍රේක්ෂකයන් ඉදිරියේ කිසියම් අවස්ථාවක් දක්වති. එවිට නාට්‍යයක් පහළ වේ." - .....................................................................................

- "නාට්‍යයක් මුලින් ම රඟ දැක්වෙන්නේ රචකයාගේ සිත නමැති වේදිකාව මත ය." - ......................... ........................................................................................................................................

- "නාට්‍යය වූ කලි කෙනෙකුගේ සිතෙහි පහළ වන නිර්මාණාත්මක ප්‍රපංචයකි." - ............................... ........................................................................................................................................

- නාට්‍යය යනු "වෘත්තාන්තමය වශයෙන් කතාවක් කීම හෝ කාර්යයන් ඔස්සේ වස්තුවක් විකාශය කිරීම" යි. "නාට්‍ය රචකයා වචන භාවිත කළ යුත්තේ මසුරකු ලෙස ය." - ......................................

- නාට්‍යයේ පෙළඹට පාදක වන්නේ යම් කතා පුවතකි. සංස්කෘත නාට්‍යයේ දී **ඉතිවෘත්තය** ලෙස හඳුන්වා ඇත්තේ මේ කතා පුවත යි. (ඉති - මෙසේ, වෘත්ත - සිදු විය) .................................. පඬිවරයා ද නාට්‍යයේ ශරීරය **ඉතිවෘත්තය** ලෙස සඳහන් කරයි.

## ➢ නාට්‍ය පිටපතක අන්තර්ගත විය යුතු ලක්ෂණ

1. ........................................................................................................................
2. ........................................................................................................................
3. ........................................................................................................................
4. ........................................................................................................................
5. ........................................................................................................................
6. ........................................................................................................................
7. ........................................................................................................................
8. ........................................................................................................................
9. ........................................................................................................................
10. ........................................................................................................................
11. ........................................................................................................................
12. ........................................................................................................................
13. ........................................................................................................................
14. ........................................................................................................................

## ➢ තල මල පිපිලා - අවබෝධය

I. නාට්‍ය කලාව සාමූහික කලා මාධ්‍යයකි. ඊට හේතු දක්වන්න.
II. නාට්‍යය සජීවී කලා මාධ්‍යයක් වීමට හේතු 3ක් දක්වන්න.
III. නාට්‍යෝචිත අවස්ථා යනු මොනවා ද?
IV. 'තලමල පිපිලා' නාට්‍යයට පාදක කර ගෙන ඇති අත්දැකීම හා එහි තේමාව කුමක් ද?
V. පාඩමේ ඇතුළත් කොටසෙහි සඳහන් වන චරිත නම් කරන්න. ඒ එක් එක් චරිතයෙන් සංකේතවත් කර ඇත්තේ මොනවා දැයි වෙන් වෙන්ව දක්වන්න.

## ➢ තල මල පිපිලා - ලිඛිත අභ්‍යාස

**1. සුදුසු පරිදි යෙදුම් තෝරා හිස්තැන් සම්පූර්ණ කරනන.**

I. නාට්‍යයක් නරඹා රස විඳින්නා ...................................... ලෙස හැඳින්වේ.
II. යම් ක්‍රියාවක් හෝ අවස්ථාවක් හෝ .......................................... කර දැක්වීම නාට්‍යය නම් වේ.
III.නාට්‍ය නිර්මාණයක මූලික කාර්යය ........................................යි
IV.නාට්‍යයක සාර්ථකත්වය උදෙසා ............................................ උපකාරී වේ.
V. සිංහබාහු නාට්‍යය ........................................... ඇසුරින් නිර්මාණය වී ඇත.
VI. තලමල පිපිලා ......................................... නාට්‍ය ශෛලියෙන් නිර්මාණය වූවකි.

(අභිනය, පෙළ රචනය, නාට්‍යෝචිත භාෂාවක්, ප්‍රේක්ෂකයා, ස්වභාවික, වංශකතාවක්, අනුකරණය, පාඨකයා)

**2. පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.**

I. පාඨකයා
II. ශිල්පීය ක්‍රම
III. පරිකල්පනය
IV. සම්භාව්‍ය
V. සාම්ප්‍රදාය

## ➢ නාට්‍ය පිටපත් - පසුගිය විභාග ප්‍රශ්න

**33.** 'තොරොක්කෝව' නම් කෙටිකතාවේ රචකයා වනුයේ, (2019 o/L)
(1) යසුනරි කවබත ය. (2) ගී ද මෝපසං ය.
(3) අකුතගාවා ය. (4) ඇන්ටන් චෙකොෆ් ය.

**37.** "මින්න මං ගැටය කාලෙ නං පේරු අගමැතිතුමා ඉස්සරහ, මහ රැජින ඉස්සරහ, සියං කුමාරයා ඉස්සරහ නැටුං නටල ප්‍රශංසා ලබලා තියෙනවා" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද? (2018 o/L)
(1) තල මල පිපිලා (2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු (4) ගුරුතරුව

**35.** තලමල පිපිලා, ගුරුතරුව, සඳගිර යන නාට්‍යවල නිර්මාණකරුවා වන්නේ, (2017 o/L)
(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය. (2) ගුණසේන ගලප්පත්ති ය.
(3) ජයලත් මනෝරත්න ය. (4) හෙන්රි ජයසේන ය.

**37.** "මගේ මිත්‍ර ඉලෝ සුබොලාඩිසේ, මොක ද අපි මේ කාරණාව එළි කළා ම ඇති වැරැද්ද? අබත්විල්ලි වතුපිට්වලට අයිතියක් නැද්ද ඔය කොලු පැටියට වගේ ම මේ මනුස්සයට?" යන දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද? (2016 o/L)
(1) තල මල පිපිලා (2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු (4) කිරිමුට්ටිය ගඟේ ගියා

**33.** මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයක් නොවන්නේ කුමක් ද? (Term test)
(1) එලොව ගිහිං මෙලොව ආවා.
(2) වෙල්ල වැහුම
(3) මනමේ
(4) දෝන කතිරිනා

37. "නැටුං ශිල්පෙ විතරක් නෙවි කොල්ලො, ජොතිසේ , වෙදකම, බලිතොවිල් , කොහොඹ කංකාරි ..... මය මිනෑ එහෙකට හපන්නු අපේ පරම්පරාව" යන දෙබස් කාණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද? (Term test)
1. හුණු වටයේ කථාව 2. ගුරුතරුව
3. අන්දරේලා 4. තල මල පිපිලා

# ➢ නාට්‍ය පිටපත් රචනය 10 ශ්‍රේණිය සිංහල (14 ඒකකය)

My Tube 071-9020298

**<u>01 නාට්‍ය කලාව සජීව කලාවකි.</u>** - වේදිකා නාට්‍ය කලාව සජීව කලාවක් වීමට හේතු වන කරුණු කිහිපයකි.
- රංගගත කරන මොහොතේ ම නැරඹිය හැකි වීම
- ප්‍රේක්ෂක ප්‍රතිචාර ඒ මොහොතේ ම ලද හැකි වීම
- රංගගත කරන මොහොතේ යම් වරදක් සිදු වුව හොත් සංස්කරණය කළ නොහැකි වීම

**<u>02 නාට්‍ය කලාව කලා මාධ්‍යයන් කිහිපයක එකතුවකි.</u>** - කාව්‍යය, ගීතය, චිත්‍රය, සංගීතය, නර්තනය ආදි සියල්ල එක්තැන් වන කලා මාධ්‍යයකි.

**<u>03 නාට්‍ය කලාව සාමූහික කලා මාධ්‍යයකි.</u>** - නාට්‍යයක් බිහි කිරීම තනි පුද්ගලයකුගේ පරිශ්‍රමයක ප්‍රතිඵලයක් නොවේ. කිහිප දෙනකුගේ සහාය ඒ සඳහා අවශ්‍ය වේ. නාට්‍ය රචකයා, නාට්‍ය අධ්‍යක්ෂවරයා, නළු නිළියන්, පසුතල නිර්මාණ ශිල්පීන්, අංග රචනා ශිල්පීන්, රංගාලෝක නිර්මාණ ශිල්පීන්, රංග වස්ත්‍රාභරණ නිර්මාණය කරන්නන්, සංගීත නිර්මාණ ශිල්පීන්, ප්‍රේක්ෂකයන් හා විචාරකයන් ආදිය ඒ සඳහා නිදර්ශන සේ දැක්විය හැකි ය.

**<u>04 'නාට්‍යය යනු කුමක් ද?</u>** - භරතමුනි පඬිවරයා මෙසේ පවසයි: 'මිනිස් ජීවිතයේ දී මුහුණ පාන්නට සිදු වන යම් සැප හෝ දුක් සහිත අවස්ථාවක් වේ ද එය ආංගික ආදි අභිනය සතරින් දැක්වූ විට නාට්‍යය යි. - (නාට්‍ය ශාස්ත්‍රය). අභින සතර හෙවත් චතුර්විධ අභිනය යනු කුමක් ද යන්න පිළිබඳවත් නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ සඳහන් වෙයි.

1. ආංගික අභිනය ............- අංග චලන මාර්ගයෙන් අදහස් ප්‍රකාශ කිරීම.
2. වාචික අභිනය ............- වචන මාර්ගයෙන් අදහස් ප්‍රකාශ කිරීම. මෙහි දී ගීත, කවි, ගද්‍යමය සංවාද ආදි කුමන හෝ මාර්ගයක් තෝරා ගත හැකි ය.
3. සාත්වික අභිනය ............- මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශනය. කෝපය, ශෝකය, විස්මය, බිය, ආදරය, කෲරත්වය ආදි ඕනෑ ම භාවයක් මුහුණේ ඉරියව්වලින් ප්‍රකාශයට පත් කළ හැකි ය.
4. ආහාර්ය අභිනය ............- ඇඳුම් පැළඳුම්, සංගීතය, වේදිකා පසුතල නිර්මාණය, රංගාලෝකනය, වේශ නිරූපණය ආදි සියලු දෑ මගින් අදහස් ප්‍රකාශනය.

**<u>05 නාට්‍ය පිටපතක අන්තර්ගත විය යුතු ලක්ෂණ</u>**

1. තේමාවක් තෝරා ගැනීම
2. කතා වස්තුව තෝරා ගැනීම
3. නාට්‍යමය අවස්ථා තෝරා ගැනීම (ප්‍රේක්ෂකයාගේ සිත් [illegible] අවස්ථා)
4. ගැටුම් අවස්ථා නිර්මාණය
5. ආරම්භය, වර්ධනය, උච්ච අවස්ථාවක් තිබීම
6. [illegible] රචනා කිරීම
7. සංවාද, විරාම [illegible] නාට්‍ය වේදිකාව ඇතුළත් කිරීම
8. රංග විධාන තිබීම

**<u>06 නාට්‍යයක ශෛලි</u>** - ප්‍රකාශන විලාසය හෙවත් නාට්‍යය ඉදිරිපත් කරන ආකාරය ශෛලිය නම් වෙයි. නාට්‍ය ශෛලි ප්‍රධාන වශයෙන් ප්‍රවර්ග දෙකකි.

01. ලෝක ධර්මී (ස්වාභාවික ශෛලිය)

නිදර්ශන කැලණි පාලම, කට්ටු ගෙවල්

02. නාට්‍ය ධර්මී (ශෛලිගත සම්ප්‍රදාය)

නිදර්ශන මනමේ, සිංහබාහු

| | ස්වාභාවික නාට්‍ය | ශෛලීගත නාට්‍ය |
|---|---|---|
| ශෛලිය | සාමාන්‍ය ජීවිතයට සමීප ශෛලියකින් ඉදිරිපත් කෙරෙයි. | සාමාන්‍ය ජීවිතයෙන් දුරස්ථ ශෛලියකින් ඉදිරිපත් කෙරෙයි. |
| දෙබස් | කතාබහ කරන ආකාරය සාමාන්‍ය ජීවිතයේ කතාබහ කරන ආකාරයට සමාන ය. | සම්පූර්ණයෙන් ම ගායනයෙන් හෝ කාව්‍යමය ශෛලියකින් දෙබස් ඉදිරිපත් වෙයි. |
| වේදිකාව මත හැසිරීම | ගමන බිමන, වේදිකාව මත හැසිරීම සාමාන්‍ය ආකාරයට සිදු වෙයි. | නර්තනය හෝ මුද්‍රා සහිත රිද්මානුකූල ගමන් තාල භාවිත කෙරෙයි. |
| ඇඳුම් පැලඳුම් හා වේශ නිරූපණය | ඇඳුම් පැලඳුම්, වේශ නිරූපණය ආදිය සාමාන්‍ය ජීවිතයේ දී භාවිත කෙරෙන ආකාරයට සකස් කර ගැනෙයි. | චරිත සඳහා විශේෂයෙන් නිර්මාණය කළ ඇඳුම් පැලඳුම් භාවිත වන අතර සැබෑ ජීවිතයේ සිදු කෙරෙන ආකාරයට වඩා කැපී පෙනෙන ලෙස වේශ නිරූපණය සිදු කෙරෙයි. |
| සංගීතය<br>පසුතල නිර්මාණ<br><br>වස්තු විෂය/ තේමාව | සංගීතය අනිවාර්ය නො වේ.<br>පසුතල නිර්මාණ භාවිත කෙරෙයි.<br>සමකාලීන සමාජ ප්‍රශ්න විෂය කර ගැනේ. | සංගීතය අනිවාර්ය වෙයි.<br>පසුතල නිර්මාණ යොදා නො ගැනෙයි.<br>බොහෝ විට ජාතක කතා, ජන කතා, පුරාණෝක්ත කතා ආදිය විෂය කර ගැනේ. (එහෙත් සමකාලීන සමාජ ප්‍රශ්න ද තේමා විය හැකි ය.) |
| නිදර්ශන | කැලණි පාලම - ආර් ආර්. සමරකෝන්<br>බෝඩිංකාරයෝ, කට්ටු ගෙවල් - සුගතපාල ද සිල්වා | මනමේ, සිංහබාහු. - එදිරිවීර සරච්චන්ද්‍ර<br>කුවේණි - හෙන්රි ජයසේන |

පාඩමේ දැක්වෙන්නේ 20 වන සියවසේ ජර්මනියේ විසූ සුප්‍රසිද්ධ නාට්‍යකරුවකු වන **බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්** විසින් රචිත **ද කොකේසියන් චෝක් සර්කල්** නම් නාට්‍යයේ පරිවර්තනයක් ලෙස **හෙන්රි ජයසේන** මහතා විසින් නිෂ්පාදනය කරන ලද **හුණුවටයේ කතාව** නම් නාට්‍යයේ අවසාන අංකයයි. (**කුවේණි** මෙතුමාගේ වෙනත් නාට්‍යකි.) හුණුවටයේ කතාව නාට්‍යයට පාදක වී ඇත්තේ අවුරුදු හයසියයකටත් වඩා පැරණි චීන ජන කතාවක් බව කියනු ලැබේ. විසි වන සියවසේ ලෝක නාට්‍ය ක්ෂේත්‍රයේ ශ්‍රේෂ්ඨතමයා බ්‍රෙෂ්ට් බව බොහෝ විචාරකයන්ගේ පිළිගැනීම යි. වෙනත් නාට්‍ය කිහිපයක් පහත දැක්වේ.

1. සුගතපාල ද සිල්වා - දුන්න දුනුගමුවේ, බෝඩිංකාරයෝ, කට්ටු ගෙවල්
2. ජයලත් මනෝරත්න- ගුරුතරුව, තලමල පීල්ලා, ඇන්දරේලා, සඳකිරි, කතෝරුමල්, ප්‍රේමණී - ගුල්ලිමුරාල්ල, සිංදුයි සිංදුයි ප්‍රේමකතනී, කෙටිකතා - මාංහට නින්ද යන්නා ඇති වැඩි එනතුරු. නවකතා - දුවාතාව තාරුණ්‍යයි.
3. එදිරිවීර සරච්චන්ද්‍ර- මනමේ, සිංහබාහු, එලොව ගියෝ මෙලොව ආවා, පබාවතී, පේමතෝ ජායතී සෝකෝ, රත්තරං, වෙස්සන්තර, මහාසාර, බවකඩතුරාව, ලෝමහංස, කදවළලු, මෙල්ලවැහැර, කිරිමුට්ටිය ගෙනේ හියා, වෙළුවේ ගෙවල් නිදිලා, කපුවා කපෝති, මඩුල් අන්නාව
4. දයානන්ද ගුණවර්ධන - නරිබෑණා
5. සෝමලතා සුබසිංහ - පුංචි ඇඹ දූ හෝරෙයි, තෝර්ටිමෙන්ලා
6. සයිමන් නවගත්තේගම - සුබ සහ යස.
7. කේ. බී. හේරත් - මදුරා කතන්දරා
8. ආර්. ආර්. සමරකෝන්- කැලණි පාලම

## ➤ තලු මල පිපිලා 11 ශ්‍රේණිය සිංහල (26 ඒකකය)

- නාට්‍යය යනු **ශ්‍රව්‍ය දෘශ්‍ය** කලා මාධ්‍යයකි. එනම් බැලීමෙන් හා ඇසීමෙන් රස විඳින මාධ්‍යයකි. නාට්‍යය වූ කලී බැලීමෙන් රස විඳීමට ඇති කාව්‍ය විශේෂයකි. ඊට **දෘශ්‍යය** යි කියන්නේ එබැවිනි. නාට්‍යයට **රූප** හෙවත් **රූපක** යයි ද කියනු ලැබේ. එය ද එම අර්ථයෙනි.

- සැබෑ ජීවිත පුවතක් හෝ ගොතන ලද කතාවක් ප්‍රේක්ෂක සමූහයක් ඉදිරියේ චතුර් අභිනය ..වාචික අභිනය, ආංගික අභිනය, සාත්වික අභිනය, ආහාර්ය අභිනය.. යොදා ගනිමින් නිරූපණය කිරීම නාට්‍යයක් ලෙස සරලව අර්ථ දැක්විය හැකි ය.

- එහි මූලික ම කර්තව්‍යය වන්නේ නාට්‍ය පිටපත හෙවත් ..නාට්‍ය රචනය.......... යි. රචකයා විසින් තමා ලද අත්දැකීමක්, කතා පුවතක් හෝ වෙනත් වස්තු බීජයක් ඇසුරු කරගෙන තම පරිකල්පනය ද ඇසුරින් නාට්‍ය පිටපත රචනා කරයි.

- “නළුවෝ ද නිළියෝ ද වෙස් වළා ගෙන අවුත් ප්‍රේක්ෂකයන් ඉදිරියේ කිසියම් අවස්ථාවක් දක්වති. එවිට නාට්‍යයක් පහළ වේ.” - ..මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර / නාට්‍ය ලෝකය..........

- “නාට්‍යයක් මුලින් ම රඟ දැක්වෙන්නේ රචකයාගේ සිත නමැති වේදිකාව මත ය.” - ..සුගතපාල ද සිල්වා. රචක බිහිවේ මෙහේ..........

- “නාට්‍යය වූ කලී කෙනෙකුගේ සිතෙහි පහළ වන නිර්මාණාත්මක ප්‍රපංචයකි.” - ..මහාචාර්ය ඇදිරිවීර සිරි නිශ්ශංක..........

- “නාට්‍ය රචකයා වචන භාවිත කළ යුත්තේ මසුරකු ලෙස ය.” - ..සුගතපාල ද සිල්වා.......... කිරීමයි (නාට්‍ය යනු ව්‍යක්තාත්මය වශයෙන් කතාවක් කීම හෝ කාර්යයක් කරන්නේ චරිතයක් විසින් ය)

- නාට්‍යයේ පෙළට පාදක වන්නේ යම් කතා පුවතකි. සංස්කෘත නාට්‍යයේ දී **ඉතිවෘත්තය** ලෙස හඳුන්වා ඇත්තේ මේ කතා පුවත යි. (ඉති - මෙසේ, වෘත්ත - සිදු විය) .............................. පණ්ඩිවරයා ද නාට්‍යයේ ශරීරය **ඉතිවෘත්තය** ලෙස සඳහන් කරයි.

### ➤ නාට්‍ය පිටපතක අන්තර්ගත විය යුතු ලක්ෂණ

1. තේමාවක් තෝරා ගැනීම
2. කතා වස්තුව තෝරා ගැනීම
3. පාඨකයාට / ප්‍රේක්ෂකයාට පණිවිඩයක් ලබා දීම (ජීවන දෘෂ්ටියක් / අරමුණක්)
4. අරමුණ කරා යාමට සිද්ධි, පෙළ නිර්මාණය.
5. නාට්‍යයේ කාලයට අනුරූප කතා විකාශනය.
6. කිසියම් ශෛලියකට රචනා කිරීම (ශෛලීගත / නාට්‍ය ධර්මී, ස්වාභාවික / ලෝක ධර්මී)
7. නාට්‍යයේ සන්දර්භය (ආරම්භය / විකාශය / උච්ච අවස්ථාව / නිරාකරණය)
8. ජවනිකා අංක යෙදීම (සන්දර්භයට අනුව)
9. විවිධ චරිත ගොඩනැගීම
10. කතා වස්තුව නාට්‍යයට උචිත අවස්ථා හඳුනා ගැනීම
11. ශෛලීගත නාට්‍ය වලදී ගැටුම් අවස්ථා යොදා ගැනීම
12. චරිත හා ගැටුම්වලට අදාළ මාන විලාසය හා සංවාද භාවිතය.
13. රංග විතාන යොදා ගැනීම
14. නාට්‍යයේ නිමාව (සුඛාන්ත / දුඃඛාන්ත)

## ➢ **<u>තල මල පිපිලා - අවබෝධය පිළිතුරු</u>**

i) නාට්‍යයක් බිහි කිරීම තනි පුද්ගලයකුගේ පරිශ්‍රමයක ප්‍රතිඵලයක් නොවේ. කිහිප දෙනකුගේ සහාය ඒ සඳහා අවශ්‍ය වේ. නාට්‍ය රචකයා, නාට්‍ය අධ්‍යක්ෂවරයා, නළු නිළියන්, පසුතල නිර්මාණ ශිල්පීන්, අංග රචනා ශිල්පීන්, රංගාලෝක නිර්මාණ ශිල්පීන්, රංග වස්ත්‍රාභරණ නිර්මාණය කරන්නන්, සංගීත නිර්මාණ ශිල්පීන්, ප්‍රේක්ෂකයන් හා විචාරකයන් ආදිය ඒ සඳහා නිදර්ශන සේ දැක්විය හැකි ය.

ii) රංගගත කරන මොහොතේ ම නැරඹිය හැකි වීම, ප්‍රේක්ෂක ප්‍රතිචාර ඒ මොහොතේ ම ලද හැකි වීම, රංගගත කරන මොහොතේ යම් වරදක් සිදු වුව හොත් සංස්කරණය කළ නොහැකි වීම.

ii) ප්‍රේක්ෂකයාගේ සිතේ කුතූහලය හා ආතතිය උපරිමයෙන් කුළුගැන්විය හැකි අවස්ථා ය.

iv) තලමල පිපිලා නාට්‍යයට පාදක වී ඇත්තේ අපගේ සමකාලීන සමාජ අත්දැකීමකි. විශේෂයෙන්ම කලාන්තරයක් මුළුල්ලේ පරම්පරානුගතව ශේෂ වී තිබුණු සිංහල සංස්කෘතික දායාද නවීකරණය, බටහිරීකරණය ඉදිරියේ විශාල වෙනස් වීම්වලට භාජනය වන ආකාරය මේ නාට්‍යයට පාදක වූ තේමාව යි.

v) රංබරණ ගුරුන්නාන්සේ අපගේ පාරම්පරික චින්තනයත්, බාල බංඩාර දෙවැනි පරපුරේ නවීකරණයත් ඔකනල් බටහිරකරණයත් ගුණවංශ රැඩිකල් වාමාංශිකයත් සභාපති අධිපති දේශපාලන ව්‍යූහයත් මහේෂිකා ජනප්‍රිය සංස්කෘතියත්, හේතු තම අක්කාගේ සංවේදනය වටහා ගත්තා වූ තුන්වැනි පරපුරත් ආදි වශයෙන් මෙහි චරිත සංකේතාත්මක ලෙස ගොඩ නැඟීමට හැකි විය.

## ➢ **<u>තල මල පිපිලා - ලිඛිත අභ්‍යාස පිළිතුරු</u>**

1. i) ප්‍රේක්ෂකයා
   ii) අභිනය
   iii) පෙළ රචනය
   iv) නාටෝචිත භාෂාවක්
   v) වංශකතාවක්
   vi) ස්වභාවික

2. i) පොත කියවා අවසානයේ **පාඨකයා** තුල නැවුම් බලාපොරොත්තු ඇති විය.
   ii) දක්ෂ සටන් කරුවා තම **ශිල්පීය ක්‍රම** මැනවින් විදහා පෑවේ ය.
   iii) කතුවරයාගේ **පරිකල්පනය** කෙටි කතාවක සාර්ථකත්වයට හේතු වේ.
   iv) **සම්භාව්‍ය** චිත්‍රපටයට සම්මාන රැසක් හිමි විය.
   v) **සාම්ප්‍රදාය** රැක ගනිමින් නූතන තාක්ෂණය වැළඳ ගැනීම කළ යුතු ය.

## ➢ **<u>නාට්‍ය පිටපත් - පසුගිය විභාග ප්‍රශ්න - පිළිතුරු</u>**

**1.** 2019 o/L – 03

**2.** 2018 o/L – 01

**3.** 2017 o/L – 03

**4.** 2016 o/L – 02

**5.** Term test – 04

**6.** Term test –` 04